# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
(රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය)

# මහජනතාව වෙත කෙරෙන වැදගත් නිවේදනයයි

## බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් මගින් මූල්‍ය පහසුකම් ලබාගැනීමේදී ඇති කරගන්නා රක්ෂණාවරණ (රක්ෂණ ඔප්පු) සම්බන්ධවයි

අ) බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් මගින් මූල්‍ය පහසුකම් ලබාගැනීමේදී, එකී සමහර බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් නම් කරන ලද රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් හෝ රක්ෂණ නියෝජිතයන් මගින් පමණක් රක්ෂණාවරණ මිලදී ගැනීමට බලපෑම් කරන බවට රක්ෂණ ඔප්පුහිමියන් විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇත.

ආ) ඔබට අවශ්‍ය රක්ෂණාවරණය ඕනෑම ලියාපදිංචි රක්ෂණ සමාගමකින් හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමකින් හෝ බලයලත් රක්ෂණ නියෝජිතවරයෙක් මගින් මිලදී ගැනීමේ අයිතිය සහ අභිමතය ඔබ සතුය.

ඇ) බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් රක්ෂණ ව්‍යාපාරයේ යෙදීම සඳහා ලියාපදිංචි ආයතන නොවන බැවින්, එම බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් ඔබට රක්ෂණාවරණ විකිණීම හෝ ඔවුන් විසින් නම් කරන රක්ෂණ සමාගම් හෝ අතරමැදියන් (ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම් හෝ බලයලත් රක්ෂණ නියෝජිතයන්) මගින් රක්ෂණාවරණ ලබා ගැනීම සඳහා ඔබට කිසිදු බලපෑමක් හෝ පෙළඹවීමක් සිදු කළ නොහැකිය.

ඈ) එම රක්ෂණාවරණයට අදාල වාරික මුදල, සෘජුවම අදාල රක්ෂණ සමාගමට, රක්ෂණ තැරැව්කාර සමාගමට හෝ රක්ෂණ සමාගම /රක්ෂණ තැරැව්කාර සමාගම විසින් නම් කරන බලයලත් රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් පමණක් සිදුකළ යුතුය.

ඉ) එලෙස යම් බැංකුවක්, මූල්‍ය සමාගමක් හෝ කල්බදු සමාගමක් රක්ෂණාවරණයක් ලබා ගැනීම සඳහා හෝ රක්ෂණාවරණයට අදාල වාරික මුදල එම ආයතන වෙත ගෙවීමට බලපෑමක් සිදුකළහොත්, ඒ පිළිබඳව වහාම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ විමර්ශණ වෙත පහත සඳහන් ලිපිනයට හෝ විද්‍යුත් තැපෑල (investigation@ircsl.gov.lk) මගින් ලිඛිතව පැමිණිලි කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඔබට අවශ්‍ය රක්ෂණාවරණය**
**ඕනෑම ලියාපදිංචි රක්ෂණ සමාගමකින් හෝ අතරමැදියෙක්**
**(ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමක් හෝ**
**බලයලත් රක්ෂණ නියෝජිතවරයෙක්)**
**මගින් මිලදී ගැනීම ඔබේ අයිතියකි.**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව,**
**11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,**
**කොළඹ 01**
**දුරකථන (011) 2335167 (පැමිණිලි) / (011) 2396184-9 ෆැක්ස් (011) 2396190**
**ඊ මේල් - info@ircsl.gov.lk වෙබ් අඩවිය - www.ircsl.gov.lk**